සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| තෙවන වාරපරීක්ෂණය 2016 | 07 ශ්‍රේණිය |
| மூன்றாம்தவணைப் பரீட்சை 2016 | தரம் 07 |
| ThirdTerm Test 2016 | Grade 07 |

| | |
|---|---|
| ගණිතය<br>கணிதம்<br>Mathematics | පැය දෙකයි<br>இரண்டுமணித்தியாலம்<br>Two hours |

නම/විභාග අංකය :- ..............................................................................................

1 කොටස

සියළුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40 කි.

1) සමපාද ත්‍රිකෝණයක සමමිති අක්ෂ ගණන කීයද?

2) සුළු කරන්න. $47 - 5 \times 8$

3) A කුලකය නිශ්චිතවම හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් මගින් ලියා දක්වන්න.




4) $2\frac{3}{7}$ , විෂම භාගයක් ලෙස දක්වන්න.

5) ක්‍රි. ව. 1898. 04. 14 දින අයත් වන ශත වර්ෂය කුමක්ද?

6) දී ඇති කෝණයේ බාහු හා ශීර්ෂය වෙන් වෙන් වශයෙන් ලියන්න.



7) 3g 25mg, මිලිග්‍රෑම් වලින් දක්වන්න.

8) දිසල් හා නිසල් අතර රු 500 ක මුදලක් 2 : 3 අනුපාතයට බෙදා ගත්තේ නම් දිසල්ට ලැබුණු මුදල කීයද?

9) මෙම ටෙසලාකරණය කුමන ටෙසලාකරණයකට අයත්වේද?



10) $\frac{2}{5}$ , දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

11) 4cm කින් 2m ක් දැක්වෙන පරිමාණ රූපයක පරිමාණය අනුපාතයක් ලෙස දක්වන්න.

12) $\frac{7}{20}$ , ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

13) රූපයේ වර්ගඵලය සොයන්න.




14) කාටිසීය තලය මත ලකුණු කර ඇති A හා B ලක්ෂ්‍ය දෙකෙහි ඛණ්ඩාංක ලියන්න.



15) රූපයේ දැක්වෙන තොරතුරු අනුව

i) PQ ට සමාන්තර රේඛාවක් නම් කරන්න.

ii) AB ට සමාන්තර රේඛාවක් නම් කරන්න.




16) පහත දැක්වෙන භාග යුගල "<"හෝ ">"සංකේත යොදා සම්බන්ධ කරන්න.

i. $\frac{3}{7}$..... $\frac{3}{5}$

ii. $\frac{3}{8}$..... $\frac{2}{5}$

17) අමල් තම නිවසේ සිට 750m පයින්ද $2\frac{1}{2}$km බසයෙන්ද ගොස් ආසන්න නගරයට පැමිණියේය. අමල් ගමන් කල මුළු දුර කොපමණද?

18) සමචතුරස්‍ර පිරමීඩයක ඇති දාර ගණන හා ශීර්ෂ ගණන ලියා දක්වන්න.

19) පාදයක දිග 3cm වන සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

20) රත්නපුර බස් නැවතුම්පලෙන් මිනිත්තු 10 කට වරක් ඇඹිලිපිටියටද, මිනිත්තු 15 කට වරක් කෑගල්ලටද, මිනිත්තු 20 කට වරක් බලංගොඩටද, බස්රථ පිටත්වේ. පෙ. ව. 8.00 ට මෙම නගර තුනටම බස්රථ පිටත් වේනම් නැවත වරක් මෙම නගර තුනටම එකවර බස්රථ පිටත්වන වේලාව කීයද?

11 කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් මුළු ලකුණු 60 කි.

1) (a) (i) 0.04, භාග සංඛ්‍යාවක් ලෙස ලියා එය සරලම ආකාරයෙන් දක්වන්න. (ල. 2)

(ii) 4.136m දිග කම්බියක් සමාන කැබලි 4 කට බෙදූවිට එක් කැබැල්ලක දිග කොපමණද? (ල. 3)

(b) (i) 96, ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියා දර්ශක ආකාරයෙන් දක්වන්න. (ල. 4)

(ii) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් අගය සොයන්න.
(-8) + (+3) (ල. 3)

2) (a) (i) පහත සඳහන් වර්ෂ වලින් අධික අවුරුදු තෝරා ලියන්න.

1881, 1998, 2000, 2002, 2016, 2200 (ල. 2)

(ii) එක්තරා අධිවේගී මාර්ගයක් අදියර තුනකින් නිම කිරීමට නියමිතය. පළමු අදියර නිම කිරීමට ගතවන කාලය මෙන් දෙගුණයක් දෙවන අදියර නිම කිරීමට ද දෙවන අදියර නිම කිරීමට ගතවන කාලය මෙන් තුන්ගුණයක් තෙවන අදියර නිම කිරීමට ද කාලය ගතවේ. පළමු අදියර නිම කිරීමට මාස 5ක් ගතවේ. අධිවේගී මාර්ගයේ වැඩ ආරම්භ කළේ 2016 - 11 - 01 වන දින නම් වැඩ නිම වන්නේ කවදාදැයි සොයන්න. (ල. 4)

(b) (i) පරිමාව $40cm^3$ වන ඝනකාභ හැඩැති පෙට්ටියක් සඳහා තිබිය හැකි දිග, පළල, උස ලියා දක්වන්න. (ල. 2)

(ii) මෝටර් රථයක් 30 km දුරක් ධාවනය කිරීමට වැයවූ ඉන්ධන ප්‍රමාණය 1*l* 920m*l* කි.එම මෝටර් රථයට 6 km දුරක් ධාවනය කිරීමට වැයවන ඉන්ධන ප්‍රමාණය සොයන්න. (ල. 2)

(iii) 2*l* 200m*l*, 2500m*l*, 2*l* 75m*l* ආරෝහණ පිළිවෙළට ලියන්න. (ල. 2)

3) (a) පහත දැක්වෙන එක් එක් සිදුවීම් දී ඇති වගුවට අදාලව තෝරා ලියන්න.

- එක සමාන රතු පබලු ඇති මල්ලකින් ඉවතට ගත් පබලුව රතු පාට වීම.
- 1 ත් 10 ත් අතර 2 හි ගුණාකාර 5 ක් තිබීම.
- අද දින සඳුදා දිනයක් නම් අනිද්දාදින බදාදා දිනයක් වීම.
- ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවත්වන ක්‍රිකට් තරගයකින් ශ්‍රී ලංකාව ජය ලැබීම.
- 1 සිට 6 තෙක් අංක යෙදූ දාදු කැටයක් උඩදැමූ විට 6 ලැබීම.
- ගැහැණු ළමුන් දෙදෙනකු සහ පිරිමි ළමයෙකු සහභාගි වන තරගයකදී පළමු වැන්නා පිරිමි ළමයෙකු වී දෙවැන්නාද පිරිමි ළමයෙකු වීම.

| ස්ථිරවම සිදුවන සිදුවීම් | ස්ථිරවම සිදුනොවන සිදුවීම් | අහඹු ලෙස සිදුවන සිදුවීම් |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(ල. 1× 6)

(b) කාර්යාලයක සතියේ දින 5 කදී සේවයට නොපැමිණි සේවකයින් ගණන දක්වන තීර ප්‍රස්තාරයක් පහත දැක්වේ.




(i) වැඩිම සේවක පිරිසක් නොපැමිණි දවස කවදාද? (ල. 2)

(ii) බදාදා දිනයට වැඩියෙන් බ්‍රහස්පතින්දා දින කී දෙනෙකු නිවාඩු ගෙන තිබේද? (ල. 2)

(iii) දින පහේදීම නිවාඩු ගෙන තිබූ මුළු සේවකයින් ගණන කීයද? (ල. 2)

4) (a) පාදයක දිග 3cm වන සවිධි ෂඩස්‍රයක් නිර්මාණයකර ෂඩස්‍රයේ බද්ධ පාද දෙකක් අතර අභ්‍යන්තර කෝණය මැන ලියන්න. (ල. 6)

(b) (i) ත්‍රිකෝණ ප්‍රිස්මයක ඇති දාර ගණන හා ශීර්ෂ ගණන ලියන්න. (ල. 2)

(ii) ඔයිලර් සම්බන්ධතාවය ලියා දක්වන්න. (ල. 2)

(iii) මුහුණත් 8 ක් සහ ශීර්ෂ 6 ක් ඇති ඝන වස්තුවේ දාර ගණන සොයන්න. (ල. 2)

5) (a) (i) වෙළෙන්දෙක් ළඟ අඹ ගෙඩි 100 ක් ඇත. ඉන් 20 ක් අමු අඹවේ. අමු අඹ ගෙඩි හා ඉදුණු අඹ ගෙඩි අතර අනුපාතය 1 : 4 බව ඔහු පවසයි. මෙම ප්‍රකාශය සත්‍ය වේද නොවේද යන්න හේතු සහිතව දක්වන්න. (ල. 3)

(ii) එක්තරා මුදලක් සඳුනි හා තරුෂි අතර3 : 5 අනුපාතයට බෙදූ විට සඳුනිට ලැබුණු මුදල රු 750 ක් වේ නම් තරුෂිට ලැබුණ මුදල රු 1 250 ක් වන බව පෙන්වන්න. (ල. 3)

(b) (i) 24% භාගයක් ලෙස සරලම ආකාරයෙන් දක්වන්න. (ල. 2)

(ii) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| $\frac{3}{4}$ | |
| 0.7 | |

(ල. 2× 2)

6) (a) (i) $7x + 3y - 2y + 5x - 3$ ප්‍රකාශය සුළු කර $x = 2$ හා $y = 3$ වන විට ප්‍රකාශනයේ අගය සොයන්න. (ල. 3)

(ii) එකක් රු $x$ බැගින් වූ චොකලට් 5 ක්ද එකක් රු 20 බැගින් වූ අයිස්පලම් 2 ක් ද මිලදී ගැනීමට රු 115 ක් වැය වේ. චොකලට් එකක මිල සොයන්න. (ල. 3)

(b) පහත දැක්වෙන ලක්ෂ්‍ය කාටීසීය තලයක ලකුණු කර A, B, C, D, A ලක්ෂ්‍ය අනුපිළිවෙලින් යා කරන්න. ලැබෙන රූපය කුමක්ද? (ල. 6)

A (2, 2) , B (6, 2), C (8, 5), D (4, 5)

7)

(a) මෙහි දැක්වෙන්නේ 20m ක් දිග 10m ක් පළල සෘජුකෝණාස්‍රාකාර ඉඩමක පරිමාණ රූපයකි. මෙහි දැක්වෙන පරිමාණයට පැත්තක දිග 30m වන සමචතුරස්‍රාකාර ඉඩමක පරිමාණ රූපය අඳින්න.




(ල. 6)

(b) (i) විශ්කම්භය 6 cm ක් වන වෘත්තයක් අඳින්න. (ල. 2)

(ii) පහත දැක්වෙන බහු අස්‍ර සඳහා දී ඇති දත්ත ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.

(ල. 4)




| රූපය | සවිධි වේද / නොවේද |
|---|---|
| a | |
| b | |
| c | |
| d | |

ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න